## උපදෙස් මාලාව

# තක්ෂිලා අත්වැල
# විශ්ව විද්‍යාලයීය ආදි තක්ෂිලානුවන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන

1. නිවැරදිව පුරවා සම්පූර්ණ කල අයදුම්පත අදාල ඇමුණුම් සමග තක්ෂිලා මධ්‍ය විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම්තුමා වෙත යොමු කල යුතුයි.

2. පහත ඇමුණුම් ඉදිරිපත් කළයුතුයි.

   අ. උප්පැන්න සහතිකයේ පිටපතක්
   ආ. අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය
   ඇ. විශ්ව විද්‍යාලයීය ප්‍රවේශ පත්‍රයේ පිටපතක් (විශ්ව විද්‍යාලයට ඇතුලත් වීමට සිටින සිසුන් ශිෂ්‍යත්වය ලබා පළමු මාස 06 තුල අදාල ලේඛනය ඉදිරිපත් කල යුතුයි.

3. ආදි ශිෂ්‍ය සංගමයේ ලේකම්තුමාගේ නිර්දේශය සමග අදාල ශිෂ්‍යත්ව ප්‍රදානය කරන කණ්ඩායම වෙත මානව සම්පත් සංවර්ධන අංශය හරහා යොමුකල යුතුයි.

4. අදාල ශිෂ්‍යත්ව ප්‍රදානය කරන කණ්ඩායම පහත පරිදි විය හැකිය.

   අ. අදාල වෘත්තීය හෝ ආදිශිෂ්‍ය කණ්ඩයම
   උදා. - වෛද්‍ය ශිෂ්‍ය අයදුම්පත් ආදි තක්ෂිලා වෛද්‍යවරුන්ගේ සංගමය වෙත යොමුවේ.
   ආ. ශිෂ්‍යත්ව ප්‍රදානයනයට දායක වන ආදි ශිෂ්‍ය කණ්ඩායමක්
   ඇ. අදාල කණ්ඩායම පැහැදිලි නොවන විට එය තක්ෂිලා මධ්‍ය විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමයේ මානව සම්පත් සංවර්ධන අංශය මගින් සම්බන්ධීකරණය සිදුකිරීමට හැකියාව ඇත.

5. අදාල ශිෂ්‍යත්ව ප්‍රදානය කරන අංශය මගින් ලබාදී ඇති අයදුම්පත සහ තොරතුරු පරීක්ෂාකර බලා, අදාල අයදුම්කරුගේ සුදුසු නුසුදුසු බව සහ ලබාදීමට නියමිත ශිෂ්‍යත්වය තීරණය කල යුතුයි. ශිෂ්‍යත්වයේ ස්වභාවය, කාලසීමාව ඇතුලු කරුණු අදාල කණ්ඩායමේ නිර්නායකයන් සහ අදාල ක්ෂේත්‍රවල අවශ්‍යතාවය අනුව සිදුකල හැකියි.

6. අවශ්‍ය කරුණු සතුටුදායක නම් අදාල අංශයේ බලයලත් නිලධාරියාගේ නිර්දේශය සහ අත්සන සහිත අයදුම්පත තක්ෂිලා මධ්‍ය විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමයේ සභාපතිතුමා වෙත යොමු කල යුතුයි.

7. ශිෂ්‍යත්වය ලබාගන්නා අවස්ථාවේ අදාල ශිෂ්‍යත්වය ලබාදෙන කණ්ඩායම/පුද්ගලයා නිර්දේශ කරන බැංකුවක ගිණුමක් ශිෂ්‍යත්වය ලබන අයදුම්කරු විසින් ආරම්භ කල යුතුයි.

8. ඉහත ගිණුමේ ශේෂය, හර, බැර තොරතුරු සන්නිවේදන විද්‍යුත් තැපෑල හෝ කෙටි පණිවුඩ අංකය අදාල ශිෂ්‍යත්ව ප්‍රදාන කණ්ඩායමේ නිර්දේශ සහ පරීක්ෂාවට ලක්කිරීමට ඉඩදිය යුතු අතර, අයදුම්කරු විසින් ඒ සදහා විරුද්ධත්වයක් නොමැති බව සඳහන් ලිපියක් අදාල ශිෂ්‍යත්ව ප්‍රදාන කණ්ඩායම වෙත, තක්ෂිලා ආදිශිෂ්‍ය සංගමයේ ලේකම්වරයාට පිටපතක් සහිතව ඉදිරිපත් කල යුතුයි.

9. විශ්ව විද්‍යාලය මගින් පවත්වන විභාග ප්‍රතිඵල යාවත්කාලීනව අදාල ශිෂ්‍යත්ව ප්‍රදාන කණ්ඩායම වෙත නොපමාව ඉදිරිපත් කල යුතුයි.

10. අදාල ශිෂ්‍යත්ව ප්‍රදාන කණ්ඩායම ශිෂ්‍යත්වය, අයදුම්කරුගේ අධ්‍යාපන ප්‍රගතිය සහ අදාල කරුණු වාර්ෂිකව විශ්ලේෂණය කල යුතුයි. ඒ සඳහා අවශ්‍ය ආකෘතිය සඳහා අදාල කණ්ඩායමට නිදහස ඇත.